www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප යුද්ධයට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට පහර ගැසීමට එරෙහිව පලාත් සභා මැතිවරන තරඟ කරයි

## Sri Lnkan SEP stands in provincial elections to oppose war and attacks on democratic rights

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2009 ජනවාරි 10**

සමාජවාදී සමානතා පක්ෂය පෙබරවාරි 14 වන දින පැවැත්වීමට නියමිත පලාත් සභා දෙකේ මැතිවරන සඳහා තරඟ කරයි. පක්ෂය මධ්‍යම පලාතේ නුවරඑලිය දිස්ත්‍රික්කයටත් වයඹ පලාතේ පුත්තලම දිස්ත්‍රික්කයටත් අපේක්ෂකයන් 19 දෙනා බැගින් ඉදිරිපත් කර ඇත.

දිවයිනේ බහුල වශයෙන් තේ වගාකරන මධ්‍යම කඳුකරයේ නුවරඑලිය දිස්ත්‍රික්කය තුල ඉතා අඩු වැටුප් ලබන, පීඩිත ශ්‍රම බලකායෙන් වැඩි කොටස දෙමල කථාකරන කම්කරුවෝ ය. බටහිර වෙරලබඩ පුත්තලම දිස්ත්‍රික්කය රටේ 25 වසරක කටුක සිවිල් යුද්ධයෙන් අවතැන්ව අනෙකුත් ප්‍රදේශවලින් පැමිනි බොහෝ ජනතාවගෙන් ද සැදුම් ලත් සිංහල, මුස්ලිම් හා දෙමල මිශ්‍ර ජනගහනයකින් යුක්ත ය.

සසප අපේක්ෂකයන් අතර වතු කම්කරුවන්, ධීවරයන්, ගොවීන්, ගුරුවරුන්, රැකියා විරහිත තරුනයන්, සිසුන් හා ගෘහනීහු වෙති. නුවරඑලිය දිස්ත්‍රික්කයේ සසප අපේක්ෂක කන්ඩායමේ නායකත්වය දරන්නේ දශක දෙකකට වැඩි කාලයක් පූර්න කාලීන පක්ෂ සංවිධායකයකු ලෙස කටයුතු කරන තිබෙන 55 හැවිරිදි මයිල්වාගනම් දේවරාජා ය. පුත්තලමේ දී දිගු කාලීන පක්ෂ සාමාජිකයෙකු වන 52 හැවිරිදි නිහාල් ගීකියනගේ මැතිවරන ව්‍යාපාරය මෙහෙයවනු ඇත.

අනෙකුත් සියලු දේශපාලන පක්ෂවලට එරෙහිව, සසප අපේක්ෂකයෝ ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව එල්ටීටීයට එරෙහිව ගෙනයන යුද්ධයට දැඩි ලෙස විරුද්ධවෙමින් උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි ඉල්ලා සිටිති.

මෙය ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක් හෝ විමුක්ති යුද්ධයක් නොව, කම්කරු පන්තියේ සිංහල, දෙමල හා මුස්ලිම් සමස්තයම මත සිංහල පාලක ප්‍රභූවේ වරප්‍රසාද හා බලය පිහිටුවා ගැනීමේ යුද්ධයකි. සසප සියලු කම්කරුවන්ගෙන් ඉල්ලා සිටින්නේ, වාර්ගික දේශපාලනයේ විෂඝෝර භේදකාරීත්වය තීරනාත්මකව ප්‍රතික්ෂේප කරන ලෙස හා සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත සිය පොදු පන්ති අවශ්‍යතාවන් සඳහා අරගලයක් තුලට ඒකාබද්ධ වන ලෙසයි.

මැතිවරනය පැවැත්වෙන්නේ හමුදාව එල්ටීටීඊයේ පරිපාලන මූලස්ථානය වන කිලිනොච්චිය අල්ලාගැනීමෙන් පසුව ඇරඹි කොලඹ දේශපාලන සංස්ථාපිතයේ ජයඝෝෂා මධ්‍යයේ ය. රාජපක්ෂ මෙය ''සමස්ත ජාතියේම ජයග්‍රහනයක්'' ලෙස ප්‍රකාශ කල අතර ''සාමයේ නිදහසේ හා ප්‍රජාතන්ත්‍රවාදයේ'' සිහිනය යථාර්තයක් බවට පත්කිරීම පිලිබඳව හමුදාවට ප්‍රශංසා කලේය.

මෙය ඔබගේ යුද්ධයක් හෝ ඔබගේ ''ජයග්‍රහනයක්'' නොවේ යයි සසප කම්කරු පන්තියට අනතුරු අඟවමින් කියා සිටියි. 1983 දී පැනනැගුනු යුද්ධය වනාහි කම්කරු පන්තිය බෙදීමත් ධනේශ්වර පාලනයේ සමාජ පදනම රැකගැනීමත් සඳහා දශක ගනනාවක් තිස්සේ අවුලුවාලන ලද දෙමල විරෝධී ස්වෝත්තමවාදයේ නිමැවුමකි. දශක දෙක හමාරක් තිස්සේ අනුප්‍රාප්තික ආන්ඩු යුද්ධය පවත්වාගෙන යමින් එහි මුලු බර වැඩකරන ජනතාවගේ කර මත පටවා ඇත.

එල්ටීටීයේ ඉතිරි බල කඳවුරුවලින් ඔවුන් පලවා හැරීමට හමුදාව සමත් වුව හොත් එයින් සිදුවනු ඇත්තේ රාජපක්ෂගේ හා ඔහු පාදක වී සිටින දේශපාලන-මිලිටරි කල්ලියේ අත ශක්තිමත් වීම පමනකි. සාමයේ හා ප්‍රජාතන්ත්‍රවාදයේ නව කාල පරිච්ඡේදයක් ඇරඹීම කෙසේ වෙතත් එවන් ''ජයග්‍රහනයක්'' තුඩු දෙනු ඇත්තේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් තවදුරටත් තලා දැමීමට හා සමාජයේ සෑම අංශයක්ම මිලිටරිකරනය වීමට ය. ''සාමයේ'' බලාපොරොත්තුව තුල හමුදාව අඩුකිරීම කෙසේ වෙතත් එහි ශක්තිය 200,000 දක්වා සියයට 50කින් පමන වැඩිකිරීමට හමුදාවට බලය පවරා ඇත.

රාජපක්ෂ 2002 සටන් විරාමය ඉරා දමා රට යලි යුද්ධයට ඇද දැමීමෙන් පසුව ගතවූ දෙවසර තුල ආන්ඩුව විරුද්ධවාදීන් බියගැන්වීමට හා මැඬීමට ත්‍රස්තයේ පාලනයක් මුදා හලේය. මිලිටරියේ අනුග්‍රහය ලත් ඝාතක කල්ලි විසින් සිය ගනන් ජනතාව අතුරුදහන් කරනු ලැබ හෝ මරා දමනු ලැබ ඇත. මාධ්‍යකරුවන්,

විරෝධය පෑ කම්කරුවන් හා ගොවීන් පමනක් නොව ශ්‍රේෂ්ඨාධිකරනය පවා ''ජාතික ආරක්ෂාව අනතුරේ හෙළීම'' පිලිබඳව ප්‍රචන්ඩත්වයේ තර්ජනයට ලක්වී ඇත. පාර්ලිමේන්තුව හිස් කෝම්බයක් බවට පිරිහෙලා තිබේ. දිවයින පාලනය කරන්නේ ලෝකයේ ලොකුම කැබිනට්ටුව මඟින් වුවත් සැබෑ තීන්දු ගනු ලබන්නේ රාජ්‍ය නිලධරයන් හා හමුදා ජෙනරාල්වරු විසින් වන අතර ඔවුන්ගේ අදහස්වලට ජනාධිපති කල්ලිය ඇහුම්කන් දෙයි.

''කිලිනොච්චි ජයග්‍රහනයේ'' පටන් ගතවූ සතිය ඇතුලත සිදුවීම්වලින් තියුනු ම අනතුරු ඇඟවීම උකහා ගත යුතුය. ජනවාරි 6 වන දින ස්වයංක්‍රීය ගිනි අවිවලින් හා අත්බෝම්බවලින් සන්නද්ධ මැර කන්ඩායමක් එම්ටීවී/සිරස මාධ්‍ය ජාලයේ කාර්යාල, විකාශන මැදිරි හා ප්‍රධාන පාලක මැදිරිය කුඩු පට්ටම් කලේය. ඊට පෙර එම ආයතනයේ විකාශන ''දේශද්‍රෝහී'' යයි හෙලා දකින ආන්ඩුවේ මෙහෙයවීම සහිත ප්‍රචාරක ව්‍යාපාරයක් පැවතුනි. ආන්ඩුව යුද්ධය පවත්වාගෙන යන ආකාරය පිලිබඳව විවේචනශීලී වූ සන්ඩේ ලීඩර් පත්‍රයේ කර්තෘ ලසන්ත වික්‍රමතුංග ජනවාරි 08 වන දින තුවක්කුකරුවන් විසින් මහ දවල් වෙඩිතබා ඝාතනය කෙරුනි.

ආන්ඩුව හා හමුදාව කම්කරු පන්තිය වෙත හැරීමට නොපැකිලෙනු ඇත. ශ්‍රී ලංකාවේ කම්කරුවන් ද මුහුනපා සිටින්නේ 1930 ගනන්වලින් පසුව ගෝලීය ධනවාදයේ උග්‍රතම අර්බුදය හමුවේ ආසියාවේත් ලෝකය පුරාත් තම රැකියා අහිමිවීමේ හා ජීවන තත්වයන් පරිහානිගත වීමේ අඳුරු අවධියකට මුනපා සිටින මිලියන සිය ගනනකගේ තත්වයටම ය. ඇඟලුම්, තේ හා අනෙකුත් භාන්ඩ අපනයන දැනටමත් තියුනු ලෙස හැකිලෙමින් තිබේ. 2006 වසරේ දී රුපියල් බිලියන 69 සිට 2008 වන විට රුපියල් බිලියන 200 දක්වා තෙගුනයකින් දැවැන්ත ලෙස ඉහල දමා ඇති මිලිටරි වියදම් මගින් ගෝලීය අර්බුදයේ බලපෑම තවත් උග්‍ර කර ඇත.

පසුගිය තෙවසර පුරාම ආන්ඩුව යුද්ධය සඳහා කැපකරන ලෙස වැඩකරන ජනතාවට බලකර තිබේ. වැටුප් වැඩිකර ගැනීමට කම්කරුවන්ගේ ද රැකියා සඳහා තරුනයන්ගේ ද සහනාධාර සඳහා ගොවීන්ගේ හා ධීවරයන්ගේ ද සමාජ ප්‍රතිලාභ සඳහා දුගීන්ගේ ද ඉල්ලීම් මතු වුනු සෑම අවස්ථාවකම රාජපක්ෂගේ සූදානම් කල පිලිතුර වූයේ මුදල් නැත යන්නයි. එහෙත් නිස්කාරනයේ මනුෂ්‍ය ජීවිත හා සම්පත් විනාශ කිරීමේ දී කිසිදු සීමාවක් ඇත්තේ නැත.

කිලිනොච්චියේ වැටීමෙන් පසුව රාජපක්ෂ මෙසේ ප්‍රකාශ කලේය. ''තවත් ටික කාලයකට ඔබගේ කැපවීම හා ඉවසීම අවශ්‍ය බව අපගේ මාතෘ භූමියේ ඉල්ලීමයි.'' එහෙත් යථාර්තය නම් හමුදාව එල්ටීටීය මැඩීමට සමත් වූව ද මාතෘ භූමිය වෙනුවෙන් කැපකිරීම් සඳහා කෙරෙන ඔහුගේ ඉල්ලීම් නතර නොවනු ඇති බවයි. කම්කරු පන්තියට එල්ල කෙරෙන ප්‍රහාරයන් තව තවත් උත්සන්න කිරීම හැරෙන්නට ආර්ථික අර්බුදයට ආන්ඩුව සතු වෙනත් විසඳුමක් ඇත්තේ නැත. වර්ගවාදය, ප්‍රචන්ඩත්වය හා පොලිස් රාජ්‍ය මර්ධනය යන යුද්ධයේ දී යොදාගත් ක්‍රම වෙදයන් තම රැකියා, ජීවන තත්වයන් හා කොන්දේසි රැක ගැනීමට සටන් වදින කම්කරුවන්ගේ විරෝධතාවන් මැඩීම සඳහා ද යොදාගැනෙනු ඇත.

කිසිදු විරුද්ධ පක්ෂයක් විකල්පයක් ඉදිරිපත් නොකරයි. දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) ද ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ)ද එල්ටීටීඊයේ විවෘත නියෝජිතයන් හැරෙන්නට අනෙක් සියලු දෙමල හා මුස්ලිම් සුලුතරයේ පක්ෂ ද මිලිටරි ජයග්‍රහන පෙරහැරට එකතුවී සිටිති. සාම සාකච්ඡා සඳහා හඬනැගීම පසෙකට ලූ එජාපය දැන් කියා සිටින්නේ එල්ටීටීඊය සමඟ 2002 දී ඇතිකරගත් සටන් විරාමය වත්මන් යුද්ධය සඳහා සූදානම් වීමට මිලිටරියට ඉඩ ලබාදුන් කදිම උපායක් වූ බවයි. තම පාර්ශ්වයෙන් ජවිපෙ කියා සිටින්නේ 2006 දී රාජපක්ෂ යුද්ධය දියත් කිරීම සඳහා තල්ලු කිරීමේ ගෞරවය තමන්ට හිමිවිය යුතු බවයි.

මෙම බඩ දඟලවන ස්වෝත්තමවාදී රැල්ලට එරෙහිව සසප අපේක්ෂකයෝ සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්මය මත පදනම්ව යුද්ධයටත් ආර්ථික අර්බුදයටත් පන්ති විසඳුමක් ඉදිරිපත් කරති. ශ්‍රී ලංකාවේ කම්කරුවන් ද බොහෝ අවස්ථාවල දී එකම අන්තර්ජාතික සංගත මගින් සූරාකෑමට ලක්කෙරෙන දකුනු ආසියාවේ හා ලෝකය පුරා විසිරී සිටින සිය පන්ති සහෝදරයන් හා සහෝදරියන් සමග එකම ගැටලු, උත්සුකතා හා අභිලාශයන් බෙදාහදා ගනිති.

ශ්‍රී ලංකාවේ යුද්ධය අති මූලික ප්‍රජාතන්ත්‍රවාදී හා ජාතික කර්තව්‍යයන් විසඳීමෙහි ලා කලාපය පුරාම ධනේශ්වර පන්තිය දක්වන නොහැකියාව පිලිබඳ වඩාත්ම කැපී පෙනෙන නිදසුනයි. ආගමික, වාර්ගික හා භාෂාමය වෙනස්කම් කම්කරු පන්තිය බෙදීම හා ධනේශ්වර පාලනයට මුක්කු ගසාගැනීම සඳහා දශක ගනනාවක් තිස්සේ උපයෝගී කරගනු ලැබ ඇත්තේ, මිලියන සිය ගනනක් සාමාන්‍ය ජනතාව විනාශයේ හෙලමිනි. මුම්බායි ජනඝාතනය හමුවේ ඉන්දියාව හා පකිස්ථානය යලි වතාවක් යුද බෙර වයමින් සිටියි. වාර්ගික හා ආගමික ජාතිවාදයටත් මිලිටරිවාදයටත් එරෙහිව ආස්ථානයක් ගැනීම මගින් ශ්‍රී ලංකාවේ කම්කරුවන් දකුනු ආසියාවේ කම්කරු පන්තියට ඉදිරි මාවත පෙන්වනු ඇත.

දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදා ඉවත්කිරීම සඳහා පෙනීසිටීම මගින් සසප එල්ටීටීඊයට කිසිදු

දේශපාලන සහයෝගයක් නොදක්වයි. එහි දෙමල බෙදුම්වාදී ක්‍රියාමාර්ගය ආන්ඩුවේ සිංහල අධිපතිවාදය නමැති වාර්ගික කාසියේ අනෙක් පැත්තයි. දෙමල ප්‍රභූ පැලැන්තියේ කොටස්වල අවශ්‍යතාව නියෝජනය කරන එල්ටීටීඊය යුද්ධය අවසන් කර දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහතික කල හැකි එකම සමාජ බලවේගය වන කම්කරු පන්තිය ඇමතීමට ඓන්ද්‍රීයවම අසමත්ය.

ජාත්‍යන්තර ''සාම වැඩ පිළිවෙල'' විසඳුමක් ඉදිරිපත් කරන්නේ යයි කියා සිටින නව සමසමාජ පක්ෂය වැනි මධ්‍යම පන්තික රැඩිකලුන් යුද්ධය මගින් හෙළිදරව් වී තිබේ. එක්සත් ජනපදය හා අනෙකුත් අධිරාජ්‍යවාදී අනුග්‍රාහකයන් සම්බන්ධයෙන් ගත් කල, සාම සාකච්ඡා වනාහි, යුද්ධය සිය කලාපීය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට බාධාවක් නොවන බව සහතික කර ගැනීම සඳහා යොදාගත් උපායක් වූවා පමනි. 2006 දී යලි ආරම්භ කල ශ්‍රී ලංකා මිලිටරියේ ආක්‍රමනයට ඔවුන් සියල්ලෝ ම නොපැකිලව සහාය දුන් අතර රාජපක්ෂ 2002 සටන් විරාමය නිල වශයෙන් බිඳ දැමූ විට කැපී පෙනෙන නිහඬතාවක් පවත්වාගෙන ගියහ. තමන් තව දුරටත් එල්ටීටීඊය සමග යලි සාම සාකච්ඡා ඇරඹීමට සහාය නොදක්වන බව දැන් එක්සත් ජනපදය විවෘතවම ප්‍රකාශ කරයි.

යුද්ධයට එරෙහි අව්‍යාජ දේශපාලන අරගලයක්, සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම් වූ කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා සටන සමග අවියෝජනීය ලෙස බද්ධ විය යුතුය. සසප අපේක්ෂකයන් කම්කරුවන්, ගොවීන් හා තරුනයන් මුහුන දෙන සමාජ අර්බුදයට සමාජවාදී විසඳුම් සඳහා උද්ඝෝෂනය ගෙන යනු ඇත. කෙසේ වුව ද කුඩා දිවයිනක වපසරිය තුල කම්කරු පන්තිය මුහුන පාන ගැටලු විසඳලිය නොහැකිය. ලොව පුරාම වැඩකරන ජනතාවෝ ආර්ථික පසුබෑමට ද හා වෙලඳ ගැටුම්වල හා යුද්ධයේ එලඹෙන තර්ජනයන්ට ද මුහුන දෙති. සසප දකුනු ආසියානු හා ලෝක සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා හා ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අරගලය පෙරට ගෙනයන්නේ එබැවිනි.

මෙම මැතිවරන ව්‍යාපාරය තුල දී හැකි පුලුල්ම ශ්‍රාවකත්වයක් කරා යාමට සසප බලාපොරොත්තු වෙයි. එබැවින් අපගේ ක්‍රියාමාර්ගයට සහාය පලකරන සියල්ලන්ගෙන් ම අප ඉල්ලා සිටින්නේ පක්ෂ අරමුදලට දායක වෙමින් ද අපගේ ප්‍රසිද්ධ රැස්වීම්වලට සහභාගී වෙමින් ද අපගේ සාහිත්‍යය බෙදාහරිමින් ද සියල්ලටත් වඩා හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙහි ශ්‍රී ලංකා ශාඛාවට බැඳීම සඳහා අයැදුම් කරමින් ද ක්‍රියාශීලීව අප හා එක්වන ලෙසයි.